# ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

## භාවිතයෙන් ඉවත් කරන ලද වාහන විකිණීම සඳහා මිල ගණන් කැඳවීම.

**ලංසු අංකය - SD/III/2025**

අංක: 150, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05 ලිපිනයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අයත් **භාවිතයෙන් ඉවත් කරන ලද** වාහන විකිණීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | වාහන අංකය | වාහන වර්ගය | විස්තරය | ලංසු සුරක්ෂණ මුදල රු. | පරීක්ෂා කර බැලිය හැකි ස්ථාන |
|---|---|---|---|---|---|
| 01 | 26-2730 | ලොරි රථය ( TATA 1210) | විකිණීම සඳහා | 50,000.00 | මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය - දියතලාව ( දු. අ. - 057-2229002) |
| 02 | 45-385 | ට්‍රැක්ටර් බවුසරය | විකිණීම සඳහා | 30,000.00 | මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය - දියතලාව ( දු. අ. - 057-2229002) |
| 03 | 32-4249 | Daihatsu කාර් රථය | විකිණීම සඳහා | 50,000.00 | ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය, අඟුණකොළපැලැස්ස (දු. අ. – 047-2229010) |

02. ඉහත සඳහන් වාහන 2025.08.01 දින සිට 2025.08.25 දින දක්වා රජයේ වැඩ කරන දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා කාලය තුල ඉහත සඳහන් ස්ථාන වලදී දෙපාර්තමේන්තු නිලධාරියෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ පරීක්ෂා කර බැලිය හැක.

03. මේ සඳහා උනන්දුවක් දක්වන ගැණුම්කරුවන්හට 2025.08.01 දින සිට 2025.08.25 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා කාලය තුළ දී මිල ගණන් ඉදිරිපත් කිරීමට අදාල ලංසු ලේඛන සඳහා ආපසු නොගෙවනු ලබන, ලේඛන ගාස්තු වශයෙන් රු.1,500.00 ක මුදලක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවා, ලබා ගන්නා ලදුපත ඉදිරිපත් කර, මිල ගණන් කැඳවීමේ ඉල්ලුම්පතක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන හා සැපයීම් අංශයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙතින් පමණක් ලබා ගත හැකිය. එසේ ලබා ගන්නා ඉල්ලුම්පත් මගින් පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතු වන අතර, එක් එක් වාහනය සඳහා ඉහත අදාළ ලංසු සුරක්ෂණය ද සමඟ වෙන වෙනම මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

04. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු පත් 2025.08.26 දින ප.ව. 02.00 ට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ප්‍රසම්පාදන හා සැපයීම් අංශයේ ඇති අදාළ ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හැකි අතර, ලංසු පත් ඇතුලත් මුද්‍රා තබන ලද කවරයේ ඉහල වම් කෙලවරේ **"භාවිතයෙන් ඉවත් කරන ලද වාහන විකිණීම සඳහා මිල ගණන් - වාහන අංකය ...................."** ලෙස සටහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, 2025.08.26 දින ප.ව.02.05 ට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන හා සැපයීම් අංශයේ දී මිල ගණන් විවෘත කරනු ලබන අතර, මිල ගණන් ඉදිරිපත් කළ අය හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතවරයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැක.

වැඩි විස්තර : දුරකථන අංක 011-2368106 වෙතින් ලබාගත හැකිය.

සර්වේයර් ජනරාල්,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
අංක150, කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.
2025.08.01